## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2017

-----------------------------------------------------------

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 25 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් පහත දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සමුච්චිත අරමුදල වශයෙන් රු. 844,877,725 ක් හා ප්‍රාග්ධන සංචිත වශයෙන් රු. 4,407,578 ක් දක්වා තිබූ අතර, ප්‍රමිතයේ 95 ඡේදය ප්‍රකාරව, එම සංචිතවල ස්වභාවය හා අරමුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල අර්ධ කාලීන පාඨමාලා ආදායම, නවීන තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයේ ආදායම, නිෂ්පාදන ශුද්ධ ආදායම් හා එම වියදම් එකිනෙකට හිළව්කර ශුද්ධ ආදායම ලෙස රු.18,936,049 ක් කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ පොලී ආදායම් රු.3,850,716 ක් බදු පෙර ලාභයට ගැලපීම් කර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒමක් ලෙස දක්වා නොතිබූ අතර නැවත ආයෝජනය කර තිබූ පොළී ආදායම් රු.3,203,994 ක් හා ස්ථාවර තැන්පතු ආපසු ලබාගැනීම් රු.3,385,250 ක් වෙන වෙනම දැක්වීම වෙනුවට එකිනෙකට හිලව්කර ශුද්ධ අගය රු.181,256 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වලට අදාල මුදල් ගලායෑම් රු.109,236,201 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.109,590,036 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් රු. 353,835 කින් වැඩියෙන් දක්වා තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අනුචිත ලෙස ඉහත වටිනාකම පෙරවර්ෂ ගැලපීම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-----------------------------------------------

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,126,866,913 ක් වූ දේපල පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ ද, ආයතනය විසින් තවදුරටත් භාවිතා කරමින් පැවතුණු අතර ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09

-----------------------------------------------

ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව භාවිතා කළ පිරිවැය සූත්‍රය ඇතුලුව තොග මැනීමේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවද ආයතනය විසින් තොග අගය කිරීමට යොදාගත් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති අංක 02 අනුව, ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් හෝ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය යන දෙකෙන් අඩුකාලයක දී මුදල් බවට පත්විය හැකි වත්කම් ජංගම වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති බව දක්වා තිබුණි. එහෙත් සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂාවට අනුව අමතර කොටස් තොගය තුළ ඇතුළත් එකතුව රු. 69,309 ක් වූ අයිතම 09 කට අයත් ඒකක 308 ක් වර්ෂ 20 කට අධික කාලයක් තිස්සේ ද එකතුව රු. 137,640 ක් වූ අයිතම 69 කට අයත් ඒකක 5,413 ක් වර්ෂ 10 ත් වර්ෂ 20 ත් අතර කාලයක් තිස්සේ ද එකතුව රු. 225,303 ක් වූ අයිතම 57 කට අයත් ඒකක 5,873 ක් වර්ෂ 03 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට ද පැවති බව අනාවරණය විය.

(ආ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කරගෙන මිලදී ගන්නා ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කළ යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ප්‍රදාන වාර්ෂිකව සියයට 10 බැගින් ක්‍රමක්ෂය කර එය විලම්භිත ආදායම් ලෙස හඳුනා ගන්නා බව දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වෙත වාර්ෂිකව ලැබී තිබුණු රජයේ ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාගවල 2017 දෙසැම්බර් 31 දිනට රු. 879,217,896 ක් වූ ශේෂය අනුචිත ලෙස ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත ආදායම් වශයෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අමතර කොටස් තොග ශේෂය රු. 585,317 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 3,958,723 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 10 ට වඩා පැරණි ණයගැති ශේෂය රු. 1,066,109 ක් වූ අතර, ඒ වෙනුවෙන් අඩමාන ණය හෝ බොල් ණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේදී තෝරාගත් ණයගැතියන් 15 දෙනෙකු වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කළ ද, ණයගැතියන් 04 දෙනෙකු විසින් පමණක් සනාථ කිරීම් එවා තිබුණු අතර, ඉන් තිදෙනෙකුගේ ණය ශේෂයේ එකතුව හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන්ගේ එකතුව අතර රු. 248,477 ක නොසැසඳීම් නිරීක්ෂණය වූ අතර, එක් ණයගැතියකු විසින් ආයතනය නමින් ණය ශේෂයක් නොමැති බවද දක්වා තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ඉඩම් | 1,149,350,000 | අයිතිය තහවුරු කෙරෙන ඉඩම් ඔප්පු හා වෙනත් ලිඛිත සාක්ෂි |
| (ii) | ණයගැතියෝ | 3,514,869 | ශේෂ සනාථ කිරීම් |
| (iii) | ණය හිමියෝ | 6,503,683 | ශේෂ සනාථ කිරීම් |
| (iv) | අමතර කොටස් තොගය | 7,009,874 | භෞතික සත්‍යාපන වාර්තා |

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු, කාලීන තැන්පතු හෝ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය නොකළ යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු. 22,495,742 ක් ද, කාලීන තැන්පතු ලෙස රු. 13,660,221 ක් ද, භාණ්ඩාගාර බිල්පත් ලෙස රු. 9,762,583 ක් ද ලෙස එකතුව රු. 45,918,546 ක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 756 | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනයක භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කල යුතු වුවද, ආයතනය විසින් 2018 ජුනි 30 දින දක්වාම 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. |

(ii) මුදල් රෙගුලාසි 772 | නුසුදුසු ලෙස ප්‍රකාශ කර ඇති භාණ්ඩ ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීමෙන් වෙන්දේසි කර හෝ ටෙන්ඩර් කැඳවා ඉවත් කිරීම සඳහා කටයුතු කල යුතු වුවත්, 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ එසේ නුසුදුසු ලෙස හඳුනාගෙන තිබූ භාණ්ඩ ඒකක 111 ක් ඉවත් කිරීම සඳහා 2018 ජුනි 30 දින තෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයෙහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 58,891,707 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,833,292 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ සියයට 1110 ක හෙවත් රු. 64,724,999 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 365 ක ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව දේපල පිරියත හා උපකරණ ක්ෂය වෙන් කිරීම රු. 50,965,278 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ඍජුවම බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2016 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.158,008,643 ක්වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.331,208,871 ක් දක්වා ධන අගයක් සහිතව අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් 2016 ට සාපේක්ෂව එහි වර්ධනය 0.06 ක සුළු අගයක් ගෙන තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පූර්ණ කාලීන පාඨමාලා සඳහා වාර්ෂිකව වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ධාරිතාවය වැඩි නොවීම හේතුවෙන් පූර්ණ කාලීන පාඨමාලා ඉල්ලුම් කරන සිසුන් ප්‍රමාණයෙන් සියයට 70 කට වැඩි පිරිසකට පාඨමාලා හැදෑරීමේ අවස්ථාව අහිමි වී තිබූ බව සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 4 ක ශිෂ්‍ය ලියාපදිංචි තොරතුරු මගින් තහවුරු වූ අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් අයදුම්කරුවන් 2,299 දෙනෙකුට පාඨමාලා හැදෑරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මකවන ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 1.2.3 යටතේ උපදේශකවරුන් පුහුණු කිරීම සඳහා රු. 1,000,000 ක් වෙන්කර තිබුණ ද ඉන් සියයට 29 ක් උපයෝජනය කර නිලධාරීන් 02 දෙනෙකුට පමණක් පුහුණුවීම් ලබා දී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සති අන්ත හා සන්ධ්‍යා කාලීන පාඨමාලා 40 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර ඒ සඳහා ශිෂ්‍යයින් 4,194 ක් සහභාගී වී තිබුණ ද එම ශිෂ්‍යයින් සඳහා පුස්තකාලය පරිහරණය කිරීමේ අවස්ථාව ලබා දී නොතිබුණි.

(ආ) අන්තර්ජාල පහසුකම් වැනි නව තාක්ෂණික ක්‍රම මගින් පුස්තකාලය නවීකරණය කර වැඩිදියුණු කිරීමට ආයතනය මගින් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) පුස්තකාලයෙන් ලැබුණු තොරතුරු අනුව 2018 ජුනි 30 දින වනවිට පුස්තකාලය තුළ අපහරණය කළ යුතු පොත් 194 ක් පැවති අතර, සමීක්ෂණයක් සිදුකර එම පොත් අපහරණය කල යුතුද යන්න හඳුනාගෙන අපහරණය කිරීමට 2018 සැප්තැම්බර් 25 දින දක්වාම කටයුතුකර නොතිබුණි.

(ඈ) ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් 2017 මූල්‍ය වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 06 ක් මගින් අනාවරණය කර තිබූ නිරීක්ෂණ සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 25 දින වන විටත් කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) ආයතනය සතුව පවතින විදුහල්පති නිල නිවස 2015 ජුනි 25 දින සිට එවකට නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආංශික නිපුණතා සංවර්ධන) තනතුර දරන ලද නිලධාරියා වෙත ලබා දී තිබුණු අතර, ශිවිසුම් කාලය ඉකුත් වී ඇති බවත්, දැනට ඔහු වෙනත් අමාත්‍යාංශයක තනතුරක් දරන බවත් නිරීක්ෂණය විය. අදාල නිල නිවස ආපසු භාරදෙන ලෙස අවස්ථා කිහිපයක දී ලිඛිතව දැනුම් දී තිබුණද 2018 ජුනි 30 දින දක්වා ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 23 දිනැති නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 6/39/1/1 දරන ලිපිය අනුව, කාර්මික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන පුහුණු ආයතනවල කාර්යමණ්ඩලයට කාර්ය සාධන දීමනා ගෙවීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේ සිට නව ක්‍රමවේදය ප්‍රකාරව කාර්යසාධනය ඇගයීම කර නිලධාරීන්ට එකතුව රු. 11,670,000 ක දීමනා ගෙවා තිබූ නමුත් නිර්ණායකයන් නිවැරදිව අර්ථ කථනය කිරීමකින් හා නිවැරදිව අගය කිරීමකින් තොරව ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ පාඨමාලා සඳහා සහභාගීවන අභ්‍යාසලාභීන් වෙනුවෙන් හදිසි අනතුරක දී වන්දි ගෙවීම සඳහා වාර්ෂිකව එක් අභ්‍යාසලාභියකුගෙන් රු. 275 ක මුදලක් අයකර ආධුනික රක්ෂණ යෝජනා ක්‍රමයක් 1999 වර්ෂයේ දී ආරම්භ කර තිබූ අතර 2017 වර්ෂය අවසාන වනවිට මෙම අරමුදලෙහි ශේෂය රු. 9,982,752 ක් වී තිබුණි. කෙසේ වුවද, එම අරමුදල සඳහා දායකත්වය සපයන සිසුන්ට ප්‍රතිලාභ ලබාදිය හැකි විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් බොරැල්ල ශාඛාවේ පවත්වාගෙන ගිය පාඨමාලා 2016 දෙසැම්බර් මාසයේ සිට රත්මලාන පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන යාමෙන් පසු එම ගොඩනැගිලි හා පුහුණු උපකරණ වසර 1 ½ ක් තිස්සේ නිෂ්ක්‍රීයව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් රු. 14,433,830 ක් වැයකර ඉදිකර තිබූ නව ආපනශාලාව 2018 ජුනි 30 දින වන විට වැඩ නිමකර මාස 07 ක් ගතවී තිබුණ ද පරිහරණයට ගෙන නොතිබුණි.

## 4.5 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය 268 ක් හා තත්‍ය කාර්යමණ්ඩලය 249 ක් වූ අතර නිලධාරීන් 22 දෙනෙකුගේ පුරප්පාඩු සහ අතිරික්ත නිලධාරීන් 3 දෙනෙකු විය. එයින් ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සෘජු බලපෑමක් ඇතිවිය හැකි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 08 ක් අතුරින් 05 ක් ම පුරප්පාඩුව පැවති අතර තවද, අනුමත නොවූ තනතුරු 02 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) වසර 4 ක් තිස්සේ පුරප්පාඩුව පැවති ලේඛකාධිකාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් තුනක දැන්වීම් පළ කිරීම සඳහා රු. 111,676 ක වියදමක් ද, අධ්‍යක්ෂ/විදුහල්පති තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථා 02 ක දී පුවත්පත් 05 ක දැන්වීම් පලකිරීම සඳහා රු. 265,218 ක වියදමක් ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ / නියෝජ්‍ය විදුහල්පති, සැලසුම් නිලධාරී, අධ්‍යක්ෂ/විදුහල්පති (ලේකම්) හා නඩත්තු සහකාර යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් 02 ක දැන්වීම් පලකිරීම වෙනුවෙන් රු. 181,125 ක වියදමක් ද දරා තිබූ අතර, 2018 ජුනි 30 දින වන විටත් ඒ කිසිදු බඳවාගැනීමක් සිදුකිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව, ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන විගණනය කිරීම සඳහා මිනිස් දින 500 ක් වෙන්කර තිබුණ ද ඒ පිළිබඳ කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය ප්‍රකාරව, ලංසුකරුවකු විසින් ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමත් ඒ සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතුය. එසේ වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු. 3,237,975 ක් වූ ආයතනය වටා ඇති තාප්පය ඔසවා ඒ මත විශේෂ ආරක්ෂිත කටු කම්බි වැටක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාලව ගිවිසුම් අත්සන් කිරීම කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 42 කට පසුව සිදු කර තිබුණි.

(ආ) එන්ජින් අංශය සහ අධිශීතකරණ හා වායු සමීකරණ අංශයට අවශ්‍ය උපකරණ 02 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු. මිලියන 5.5 ක් වෙන්කර තිබුණ ද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී එම උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අපොහොසත් වී තිබුණි.

#### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව දික් අඩි 4,150 ක් සඳහා දික් අඩියක් රු. 500 බැගින් රු. 2,075,000 ක වටිනාකමක් දක්වා තිබූ, කොන්ත්‍රාත් වටිනාකම රු. 4,095,545 ක් වූ ප්‍රාථමික අංශය සඳහා ඉදිකරන ලද C ගොඩනැගිල්ල (III) අදියරෙහි වහල ගැසීමට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුවේ අංක 4 අයිතමය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ මිල ප්‍රමාණ පත්‍රයේ එම අයිතමය සඳහා දික් අඩියක මිල රු. 52.41 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, ඇස්තමේන්තුගත ඒකක වටිනාකම හා බිල්පතේ එම අයිතමයේ ඒකක වටිනාකම අතර රු. 447.59 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් අයිතම් 10 ක ප්‍රමාණයන් හා අවසන් බිල්පතෙහි සඳහන් ප්‍රමාණයන් අතර සියයට 2 ක සිට සියයට 95 ක් දක්වා විචලතා නිරීක්ෂණය වූයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ නිවැරදිභාවය පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

### 6.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය 2017 වර්ෂයේ ආරම්භයේ සකස් කර තිබූ අතර, එය 2017 නොවැම්බර් 20 දින සංශෝධනය කර තිබුණද වැය විෂයයන් 10 ක සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසය තුළ වාර්ෂික ප්‍රතිපාදනවල ඉතිරිවීම් හා වැය විෂයයන් 08 ක සියයට 21 සිට සියයට 233 දක්වා වූ පරාසය තුළ ප්‍රතිපාදන ඉක්මවීම් නිරීක්ෂණය වූ අතර, ආයතනය විසින් වාර්ෂික අයවැය ලේඛනය කළමනාකරණ කාරයකයක් ලෙස ඵලදායීව උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2006 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද 2015 සහ 2016 වර්ෂයන්ට අදාල ආයතනයේ වාර්ෂික වාර්තා 2018 අගෝස්තු 30 දින වන විට ද පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අපොහොසත් වී තිබුණි.

## 6.5 නොවිසදී අති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2015 දෙසැම්බර් සිට නව සේවක අන්තර්ග්‍රහණය යටතේ වැටුප් වර්ධක සමග වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණද, ඒ සඳහා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 19 ඡේදය ප්‍රකාරව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුමේ සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එබැවින් 2016 වර්ෂයේ සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ සේවක පාරිතෝෂික මුදල් ගණනය කිරීමේදී අන්තර්ග්‍රහණයේ දී ලබා දී තිබූ වැටුප් වර්ධක නොසලකා හැරීමට සිදුවී තිබුණි.

(ආ) ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වී පෞද්ගලික ආයතනයක සේවය කර තිබුණු නිලධාරියකු ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව නැවත සේවයේ පිහිටුවා තිබූ අතර අඛණ්ඩව සේවය කළ නිලධාරියකු ලෙස සලකා සේවය නොකළ කාලය සඳහා රු.105,402 ක සම්පූර්ණ වැටුප් හා දීමනා හා අදාල වැටුප් පියවරයන් ද ලබාදී තිබුණි.

(ඇ) වටිනාකම රු.1,103,200 ක්වූ පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.591,100 ක් වැයකර තිබුණද එහි පැවති අඩුපාඩු හා දෝෂ හේතුවෙන් එම පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | දීර්ඝ කාලයක සිට ඉහළ කළමනාකරණ මට්ටම්වල තනතුරු පුරප්පාඩු පිරවීමට අපොහොසත් වීම හා සේවා ව්‍යවස්ථා හා අනුමත වැටුප් ව්‍යුහයන් සම්බන්ධ පැනනැගී ඇති ගැටළු නිරාකරණය නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | (i) මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි පරිගණක ගත විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දෝෂ පැවතීම. |
| | (ii) ජර්නල් වවුචර් පිළියෙල නොකිරීම. |

| | |
|---|---|
| (ඇ) ණයගැති පාලනය | වාර්තා නිසි පරිදි නඩත්තු කර හිඟ ණය ශේෂ අයකර නොගැනීම. |
| (ඇ) කොන්ත්‍රාත් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු මෙහෙයවීමට අපොහොසත්වීම හා නිසි ප්‍රමිතියකින් යුතුව වැඩ නිම කරවා නොගැනීම. |